ප්‍රධාන කරුණු සංක්ෂිප්තය

PFC FUTURE INVESTOR යෝජනාක්‍රමය

නිමැවුමේ ස්වභාවය	ගනුදෙනුකරුට ලැබෙන ප්‍රතිලාභ	ආරම්භක තැන්පතු හා ගාස්තු	සුදුසුකම	ප්‍රධාන නියමයන් හා කොන්දේසි
බාලවයස්කරුවන් සඳහා වන පුද්ගලික විදේශ මුදල් ආයෝජන සැලැස්ම	• **පොලී අනුපාතය : 3% (AER 3.04%)** • ගිණුම ඇමරිකානු ඩොලර්වලින් විවෘත කර පවත්වාගෙන යා යුතුය. • වසර 1,2,3,4 හා 5ක කාල සීමාවන් සඳහා තැන්පතු සැලසුම් පවතී. • ගනුදෙනුකරුවන් විසින් තැන්පත් කරන මාසික දායක මුදල මත විවිධ තැන්පතු සැලසුම් විකල්ප පිරිනමනු ලැබේ. • කල්පිරීමෙන් පසු ගිණුම්හිමියා විසින් අරමුදල් ආපසු ගන්නා තෙක් PFC ඉතුරුම් අනුපාතය +1% යන පොලී අනුපාතය යටතේ සාමාන්‍ය PFC ස්ථාවර තැන්පතුවක් ලෙස ඉදිරියට පවත්වාගෙන යනු ලැබේ. • ගිණුම්හිමියා සඳහා වෛද්‍ය රක්ෂණාවරණය • ගිණුම විවෘතකරන දෙමාපියන්/භාරකරු සඳහා ජීවිත රක්ෂණාවරණය • ගිණුම් විවෘතකරන දෙමාපියන්ට හෝ භාරකරුට Flex ජංගම යෙදුම හරහා ශේෂය විමසිය හැකිය. • එකම බාලවයස්කරු සඳහා ගිණුම් කිහිපයක් විවෘත කළ හැකිය.	• **ආයෝජන සැලැස්ම** කල්පිරීමේ වටිනාකම (ඇ.ඩො.) — කාල සීමාව: අවු 1, අවු 2, අවු 3, අවු 4, අවු 5 — මාසික තැන්පතුව (ඇ.ඩො.) 1,000: 83, 41, 27, 20, 16 5,000: 412, 203, 134, 99, 78 10,000: 825, 410, 270, 200, 158 • **ගිණුම වසාදැමීමේ ගාස්තු** : බැංකුවේ දැනට පවතින ස්ථාවර තැන්පතු වසා දැමීමේ ක්‍රමවේදය යටතේ ගිණුම වසාදැමිය හැකිය. • **ගිණුම පවත්වාගෙන යාමේ හා වෙනත් ගාස්තු** - ගිණුම් ශේෂ තහවුරුව - අන්තර්ජාල බැංකුකරණ සේවා ගාස්තු ගාස්තු දැනගැනීමට https://www.boc.lk/rates-tariff#general-tariff වෙත පිවිසෙන්න. • **බදු** - පොලිය රජය සහ/හෝ ශ්‍රී ලංකා නියාමන අධිකාරිය හෝ බැංකුව විසින් කලින් කලට නියමකරනු ලබන අදාළ ඉහළ ආදායම් බදු (Advance Income Tax) අඩුකිරීම්, වෙනත් බදු (AIT), ගාස්තු (ඇත්නම්) වලට සහ ව්‍යවස්ථාපිත අයබදුවලට යටත් වේ.	• ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත වාසයකරන ශ්‍රී ලාංකික ජාතිකයකු වන, • ශ්‍රී ලාංකික සම්භවයක් ඇති සහ ශ්‍රී ලංකාවෙන් පිටත පදිංචිකරුවකු වන, • ශ්‍රී ලංකාවේ වාසයකරන විදේශිකයකු වන, වයස අවුරුදු 17ට අඩු බාලවයස්කරුවන් මෙම ගිණුම විවෘත්කිරීමට සුදුසුකම් ලබයි. **ගිණුම විවෘතකිරීම සඳහා අනුගමනය කළයුතු පියවර** - බාලවයස්කරුගේ හා ගිණුම විවෘතකරන දෙමාපියන්/භාරකරුගේ විදේශ ගමන් බලපත්‍රයේ ජීව දත්ත පිටුවේ පිටපතක් (ඡායාරූපය සමග) (ශ්‍රී ලංකාවේ පදිංචි ශ්‍රී ලාංකික ජාතිකයින් සඳහා අනිවාර්ය නොවේ) - ශ්‍රී ලංකාවේ වාසය නොකරන බාලවයස්කරුවන් සහ විදේශයේ පදිංචි බාලවයස්කරුවන් සඳහා වීසා බලපත්‍රයේ පිටපතක් - උප්පැන්න සහතිකයේ පිටපතක් - දෙමාපියන්ගේ හෝ භාරකරුගේ ස්ථිර ලිපිනය තහවුරුකිරීමේ ලේඛනයේ පිටපතක් - ගිණුම විවෘතකරන දෙමාපියන්/භාරකරුගේ සුදුසුකම් හා ආදායම් මූලාශ්‍රය තහවුරු කිරීම සඳහා අදාළ ලේඛනගත සාක්ෂි සමග බාලවයස්කාර ඉතුරුම් ගිණුම් විවෘතකිරීමේ විශේෂ අයදුම්පත පුරවා ඕනෑම බැංකු ශාඛාවක් වෙත ලබාදෙන්න.	• මෙම ගිණුමේ යම් යම් කොන්දේසි සහ/හෝ ඊට පිරිනමන යම් පහසුකමක් වෙනස් කිරීමට, එකතු කිරීමට හෝ සංශෝධනය කිරීමට බැංකුවට අයිතිය ඇත. • කල්පිරීමට පෙර ගිණුම වසාදැමීමේදී, PFC බාලවයස්කාර ස්ථාවර තැන්පතු ගිණුමේ පවතින ගාස්තු අදාළ වේ. • කල්පිරීමෙන් පසු, මෙම ගිණුම PFC ඉතුරුම් අනුපාතය + 1% හෝ බැංකුව විසින් තීරණය කරන ලද අනුපාතයක පොලියක් සමඟ ඒ යටතේම දිගටම පවතින අතර, ගිණුම්හිමියා වයස අවුරුදු 18ට ළඟා වූ පසු, ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර, ජාතික හැඳුනුම්පතක් හෝ විදේශ ගමන් බලපත්‍රයක් වැනි වලංගු අනන්‍යතා ලේඛන ලබාදීමෙන් පසුව පමණක් එය වසා දැමිය හැකිය.

රක්ෂණ ආවරණ තැන්පතුව /අනවසර ගනුදෙනු (අතපසුවීම්)/ අක්‍රීය ගිණුම් පිළිබඳ වාර්තාකිරීම

- තැන්පතුකරුවකුට රු.1,100,000 ක උපරිමයක් දක්වා වන්දි සඳහා අදාළ වාරික ගෙවීම මත මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනාක්‍රමය අනුව තැන්පතු වගකීම් රක්ෂණය කර ඇත.
- අනවසර/ අතපසුවූ ගනුදෙනුවක් හඳුනාගතහොත්, ඒ පිළිබඳ බැංකුවට හෝ ගිණුම පවත්වාගෙනයන ශාඛාවට වහාම වාර්තාකළ යුතුය.
- කිසිම මුදල් ආපසුගැනීමක්/ගෙවීමක් නොකර අවුරුද්දක (01) කාලයක් ගිණුම අක්‍රීයව පැවතියහොත්, එක් අවුරුද්දක් අවසානයේ ගිණුම 'අක්‍රීය' වනු ඇත.
- අවුරුදු 10කට වැඩි කාලයක් එම ගිණුම් සක්‍රීයව පැවති බවට කිසිදු සාක්ෂියක් නොමැති නම්, එම ගිණුම්වල පවතින මුදල් අත්හැර දැමූ දේපළක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව වෙත මාරුකරනු ලැබේ.

ඔබේ අදහස් අප හා බෙදාගන්න

- ගනුදෙනුකරුවන්ට පහත දැක්වෙන කුමන හෝ ක්‍රමයකින් සිය අදහස් සහ පැමිණිලි යොමුකළ හැකිය;
- අපගේ ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරණ අංශය හරහා ඔබේ ඇගයීම්/ පැමිණිලි යොමු කළ හැකිය. ඔබේ ඉල්ලීම් ස්වයංක්‍රීය පද්ධතියක් හරහා ප්‍රමුඛතාව පදනම් කොටගෙන සලකා බලනු ලැබේ.
- දුරකතන: +94 11 220 4750 / +94 11 243 5814 ෆැක්ස්: +94 11 243 5815 විද්‍යුත් ලිපිනය: bocexmgt@boc.lk වෙබ් අඩවිය: https://www.boc.lk තැපැල: ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරු, 22වන මහල ලංකා බැංකු කුළුණ, ලංකා බැංකු චතුරශ්‍රය, අංක. 1, ලංකා බැංකු මාවත, කොළඹ 01.
- අපගේ කුමන හෝ ශාඛාවක්, සේවා ඒකකයක්, හෝ ඇමතුම් මධ්‍යස්ථානය අමතන්න.අපගේ නිමැවුම් හෝ සේවා සම්බන්ධයෙන් ඇති ඕනෑම විමසීමක් අපගේ ඕනෑම බැංකු ශාඛාවක් වෙත හෝ ඇමතුම් මධ්‍යස්ථානය වෙත යොමු කරන්න. 1975 (ඇමතුම් මධ්‍යස්ථානය) අමතා ඔබට ළඟම ශාඛාව සොයාගන්න.